ඉංග්‍රීසි පිටපත පාදක කරගෙන මෙම ව්‍යා.ද.ප. සිංහලයට පරිවර්තනය කරන ලදී 17 සැප්තැම්බර් 2013

# ව්‍යාපෘති දත්ත පත්‍රිකා

කිසියම් ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රිකාවල (ව්‍යා.ද.ප.) ඇතුළත් වේ. ඊට හේතුව නම්, ව්‍යා.ද.ප. යනු සම්පූර්ණ කෙරෙමින් පවතින පත්‍රිකා බැවින් ඒවායේ ආරම්භක පිටපතේ ඇතැම් තොරතුරු අන්තර්ගත නොවීමට ඉඩ ඇති අතර එම තොරතුරු ලැබුණු පසු අන්තර් ගත කරනු ලැබේ. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු වෙනස්වීමේ ඉඩක් ඇති අතර සූචන දත්ත වශයෙන් පමණක් පවතී.

| | |
|---|---|
| ව්‍යා.ද.ප. නිර්මාණය කළ දිනය | 1 අප්‍රේල් 13 |
| ව්‍යා.ද.ප. යාවත් කාලීන කළ දිනය | 3 අප්‍රේල් 13 |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ නම** | ශ්‍රී නේෂන් ට්‍රස්ට් බැංකුවට ලබා දෙන ජ්‍යෙෂ්ඨ නොසුරැකුණු ණය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍ය ව්‍යාපෘතිය |
| **ණය ලබන්නාගේ / සම කොටස් ආයෝජකයාගේ නම** | නේෂන් ට්‍රස්ට් බැංකුව |
| **රට** | ශ්‍රී ලංකාව |
| **ව්‍යාපෘතිය/වැඩසටහන් අංකය** | 46924-014 |
| **තත්ත්වය** | **අනුමත කර තිබේ** |
| **භූගෝලීය පිහිටීම** | ශ්‍රී ලංකාව |

කිසියම් රටක වැඩසටහනක් හෝ මූලෝපයක් සැලසුම් කිරීමේ දී, කිසියම් ව්‍යාපෘතියක් සඳහා මුදල් ලබා දීමේ දී හෝ කිසියම් නිමිතිකරණයක දී, හෝ මෙම ලේඛනයේ සඳහන් වන විශේෂිත භූමියක දී හෝ භූගෝලීය ප්‍රදේශයක දී, නෛතික පද්ධතියට හෝ වෙනත් තත්ත්වයකට අනුකූල වන අයුරින් කිසියම් භූමියක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් යම් තීරණවලට එළැඹීමට ආසියානු සංවර්ධන බැංකුව මෙහිදී අපේක්ෂා නොකරයි.

| | |
|---|---|
| **ක්ෂේත්‍රය සහ/හෝ උපක්ෂේත්‍රය වර්ගීකරණය** | මූල්‍ය / බැංකු ක්‍රමය |
| **තේමාත්මක වර්ගීකරණය** | ආර්ථික වර්ධනය / පෞද්ගලික අංශය සංවර්ධනය |
| **ස්ත්‍රී/පුරුෂභාව මුඛ්‍යධාරාකරණ අංශ** | - |

## අරමුදල් සැපයීම

| වර්ගය/ආධාරය සිදු කෙරෙන ආකාරය | අනුමැති අංකය | අරමුදල් සැපයීමේ මූලාශ්‍රය | අනුමත මුදල (දහස්) |
|---|---|---|---|
| PS | 7382 | ලේඛන සාකච්ඡා මට්ටමේ පවතී | 0 |
| **එකතුව** | | | ඇ.ඩො.0 |

## පාරිසරික සහ සමාජ ගැටලු පිළිබඳ සාරාංශය

| | |
|---|---|
| පාරිසරික අංශ | - |
| ස්වේච්ඡා නොවන ප්‍රතිවාසනය | - |
| ආදිවාසී ජනතාව | - |

## පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගීත්වය සහ සමූපදේශය

ව්‍යාපෘතිය සැලසුම් කරන කාලය අතරතුර

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය අතරතුර

## විස්තරය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (SME අංශයට) ණය ලබා දීම සඳහා නේෂන් ට්‍රස්ට් බැංකුව (NTB බැංකුව) වෙත ආසියානු සංවර්ධන බැංකුව (ADB බැංකුව) මගින් අවුරුදු 5ක කාලයක් සඳහා ලබා දෙන ඩොලර් මිලියන 15ක ණය මුදලක් ව්‍යාපෘතියට ඇතුලත් වෙයි. SME අංශයේ මුදල් සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට සහ අරමුදල් ලබා ගැනීමට වැඩි ඉඩකඩක් ලබා දීමට මෙම ව්‍යාපෘතිය උපකාරී වෙයි. දිගු කාලීන මූල්‍ය පහසුකම් ලබා දීම මගින් ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ වර්ධනයට මෙමගින් ආධාර කෙරෙයි. පරිපූර්ණ මූල්‍ය සංවර්ධනය දිරිමත් කිරීමේ අරමුණ ඇතිව NTB බැංකුව ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රදේශ සඳහා ණය දීම තුලින් භූගෝලීය පදනම මත සැකසුන ඉලක්ක මෙන්ම SME අංශයේ කටයුතුවලට සහභාගී වන කාන්තාවන්ට ආධාර කිරීම තුලින් ස්ත්‍රී පුරුෂ සමතාවය පදනම් කර ගත් ඉලක්කද ව්‍යාපෘතියට ඇතුලත් කර තිබේ.

## අරමුණ සහ විෂය පථය

SME කටයුතුවලට ණය ලබා දීමට ආධාර කිරීම සඳහා ADB බැංකුව ඩොලර් මිලියන 15ක ජ්‍යෙෂ්ඨ සුරකුම් නොවන ණය මුදලක් අවුරුදු 5ක කාල සීමාවක් සඳහා NTB බැංකුවට ලබා දීමට යෝජනා කරයි. මෙම ණය මුදල ADB විසින් අදියර දෙකකින් මුදාහරින අතර ඒ මගින් NTB බැංකුවේ වර්ධනයේ නිසි කළමණාකාරීත්වයක් අපේක්ෂා කරන අතරම දැනට IMF මගින් ක්‍රියාත්මක වන සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරික ශිල්පීය ආධාර වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිලාභද ඉලක්කගතය. වර්ෂයකට ආදායම රුපියල් මිලියන 600 නොඉක්මවන SME ව්‍යාපාරවලට ADB බැංකුවේ ආධාර යටතේ ණය ලබා දෙනු ලැබේ. රුපියල් මිලියන 600ක මෙම සීමාව මහ බැංකුවේ නිර්නායකයන් සමගද ගැලපේ. ADB බැංකුව ලබා දෙන පහසුකම්

වලින් අවම වශයෙන් 50% ක මුදලක් කොළඹින් බැහැර පිහිටි SME ව්‍යාපාරවලට ණය කටයුතු සඳහා යෙදවීමට මෙම ව්‍යාපෘතිය ඉලක්ක කර තිබේ. මෙම 50%න් 30% ක් සිවිල් යුද්ධයෙන් සහ සුනාමි උවදුරෙන් බලපෑමට ලක් වුණු උතුරු නැගෙනහිර හා දකුණු පළාත්වල තිබෙන අලුතින් ව්‍යාපර ඇරඹීමට හෝ දැනට තිබෙන ව්‍යාපාර පුළුල් කිරීමට මූල්‍ය පහසුකම් සැපයීමට අපේක්ෂිත අතර එමගින් ඒ ප්‍රදේශවල විරැකියාව අඩු කිරීම ඉලක්ක කර තිබේ. කාන්තාවන්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීම දිරිමත් කිරීම සඳහා ADB බැංකුව ලබාදෙන පහසුකම්වලින් 20%කට සමාන මුදලක් කාන්තාවන්ට හිමිකම ඇති හෝ ඔවුන් විසින් පාලනය කරනු ලබන SME ව්‍යාපාර වලට ණය දෙනු ලැබේ.

## ■ ව්‍යාපෘතිය සාධාරණීයකරණය සහ දේශීය / කලාපීය උපක්‍රමයට ඇති සම්බන්ධය

මෙම ව්‍යාපෘතිය මගින් මධ්‍යම ප්‍රමාණයේ බැංකුවල ආයතනික හා මූල්‍යම සංවර්ධනය ඉලක්ක කරමින් ඒවා මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ණය දීමේ හැකියාව පුලුල් කිරීම නැතහොත් එවැනි මධ්‍යම පරිමාණයේ බැංකුවල මූල්‍යමය හැකියාව ප්‍රසාරණය කිරීම අපේක්ෂිතය.

## ■ සංවර්ධන බලපෑම

-

## ■ ප්‍රතිඵල සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

| ව්‍යාපෘතියේ ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්ත්වය (ප්‍රතිදානය, ක්‍රියාමාර්ග, සහ ගැටලු) |
| --- | --- |
| **ව්‍යාපෘතියේ ප්‍රතිඵල වන්නේ,**<br>i) SME ව්‍යාපාරවලට ලබාදෙන ණය මුදල් සංඛ්‍යාව හා පරිමාව මෙන්ම ණය ලබා දෙනු ලබන කාලය අනුව SME ව්‍යාපාර සඳහා ඇති මූල්‍ය පහසුකම් වැඩි කිරීම.<br>ii) උතුරු, නැගෙනහිර හා දකුණු පළාත්වල කටයුතු කරන SME ව්‍යාපාරවලට (2015 වන විට 30% ක්) සහ ණය ගනු ලබන කාන්තාවන්ට (2015 වන විට ADB බැංකුව මුදාහරින් මුළු ප්‍රමාණයෙන් 20% ක්) ලබා දීම පෙර දැරි කරගෙන NTB බැංකුවේ | - |

SME ව්‍යාපාර ණය ක්‍රියාදාම භූගෝලීය වශයෙන් හා ස්ත්‍රී පුරුෂ සමතාවය අනුව විවිධාංගිකරණය කිරීම හා

iii) ADB බැංකුවේ ආරක්ෂිත ප්‍රතිපත්ති ප්‍රකාශය (2009) ට අනුකූලතාවය දැක්වීමයි.

| සංවර්ධන අභිමතාර්ථවල තත්ත්වය | වාස්තවික වෙනස්කම් |
|---|---|
| – | – |

## ■ ව්‍යාපාරික අවස්ථා

**පළමුවරට ලයිස්තුගත කළ දිනය** -

**උපදේශන සේවා**
-

**ප්‍රසම්පාදනය**
-

**ප්‍රසම්පාදන සහ උපදේශන සටහන්**

http://www.adb.org/projects/46924-014/business-opportunities

## ■ කාල සටහන

| | |
|---|---|
| **සංකල්ප නිෂ්කාශනය** | 16 ජුලි 12 |
| **තොරතුරු-සෙවීම** | - |
| **කළමනාකරණ සමාලෝචන රැස්වීම** | 16 ජුලි 12 |
| **අනුමැතිය** | 6 පෙබරවාරි 13 |
| **අවසන් වරට සිදු කෙරුණු සමාලෝචන මෙහෙයුම** | - |

## ■ වැදගත් සංධිස්ථාන

| අනුමැති අංකය | අනුමැතිය | අත්සන් කිරීම | වලදායිත්වය | අවසානය | | |
|---|---|---|---|---|---|---|
| | | | | මුල් ස්වරූපය | සමාලෝචිත | තථ්‍ය |
| - | - | - | - | - | - | - |

## සම්බන්ධතා සහ යාවත්කාලීන විස්තර

| | |
|---|---|
| වගකිව යුතු ආ.සං.බැ. නිලධාරියා | මොනිෂා ඒ. හර්මන්ස් (mhermans@adb.org) |
| වගකිව යුතු ආ.සං.බැ. දෙපාර්තමේන්තුව | පෞද්ගලික මෙහෙයුම් දෙපාර්තමේන්තුව |
| වගකිව යුතු ආ.සං.බැ. අංශය | PSFI |
| ක්‍රියාත්මක කරන නියෝජිතායතන | - |

## ඇඳුම් / සබැඳුම

| | |
|---|---|
| ව්‍යාපෘති වෙබ් අඩවිය | http://www.adb.org/projects/46924-014/main |
| ව්‍යාපෘති ලේඛන ලැයිස්තුව | http://www.adb.org/projects/46924-014/documents |